දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2013 පරීක්ෂණය - 2016 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part II 2013 Examination – January/February 2016

## ආවිසා 3.1 - ප්‍රායෝගික ආර්ථික විද්‍යාව
## ECG 3.1 - Applied Economics

**කාලය පැය තුන යි**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ**

---

01. (i) 1977 න් පසු ක්‍රියාත්මක කරනු ලැබූ ලිහිල් ආර්ථික ප්‍රතිසංස්කරණ යටතේ ඉහළ ආර්ථික වෘද්ධි අනුපාතිකයක් සහිත දිගු කාලීන ආර්ථික සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට වර්ධනය කර ගත යුතු සංවර්ධන උපාය මාර්ග කවරේ ද? පැහැදිලි කරන්න.
(ලකුණු 10)

(ii) මානව සංවර්ධන ක්‍රියාකාරකම් මිණුම් කිරීම සඳහා පිළිගත් සංයුක්ත දර්ශක නම් කොට ශ්‍රී ලංකාව ඇසුරින් මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා සහ දුබලතා විග්‍රහ කරන්න.
(ලකුණු 10)

02. (i) ශ්‍රී ලංකාවේ මෑත කාලීන කෘෂිකාර්මික අංශයේ පසුබෑමට බලපෑ හේතු දක්වන්න.
(ලකුණු 10)

(ii) සාම්ප්‍රදායික යැපුම් කෘෂි අංශය ඉහල ඵලදායිතාවයෙන් යුක්ත අංශයක් බවට පරිවර්තනය කිරීමෙහිලා දස අවුරුදු සංවර්ධන සැලැස්ම (2006 - 2016 මහින්ද චින්තන දැක්ම) යෝජනා කොට ඇති උපාය මාර්ග පිළිබඳ විමසුමක යෙදෙන්න.
(ලකුණු 10)

03. (i) ඉහළ රාජ්‍ය මූල්‍ය හිඟයක් ආර්ථිකයට බරපතල ප්‍රතිවිපාක ගෙන දෙන්නේ කෙසේදැයි මෑත කාලීන ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අත්දැකීම් ඇසුරින් පරීක්ෂා කරන්න.
(ලකුණු 10)

(ii) මෑත කාලීන ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අසමතුලිතතාවය පෙන්වා දී ඒවා ආර්ථික ස්ථාවරත්වයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 10)

04. (i) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟය පුළුල් වී ඇති ආකාරය සංඛ්‍යා තොරතුරු සහිතව දක්වා ඊට බලපා ඇති හේතු සාධක දක්වන්න.
(ලකුණු 10)

(ii) වෙළඳ පරතරය පුළුල් වීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද?
(ලකුණු 10)

05. (i) ශ්‍රී ලංකාවේ ජනවිද්‍යාත්මක වෙනස්කම් (demographic changes) ආර්ථික වෘද්ධිය කෙරෙහි කෙලෙස බලපානු ලැබේ ද?

(ලකුණු 06)

(ii) ජනගහනයේ වයස් ව්‍යුහය වෙනස්වීමේ අභියෝගයට මුහුණ දීමට අනුගමනය කළ යුතු ක්‍රමෝපායන් මොනවා ද?

(ලකුණු 06)

(iii) ජනගහන වර්ධනය හා ආහාර නිෂ්පාදනය අතර සම්බන්ධතාවය පැහැදිලි කෙරෙන ආර්.ආර්. නෙල්සන්ගේ (මෝල්තසියානු සංකල්පය) න්‍යාය ප්‍රස්ථාර සටහන් උපයෝගී කර ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

06. (i) ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය (ශ්‍රම හමුදා සහභාගිත්ව අනුපාතිකය) නිර්වචනය කරන්න.

(ලකුණු 06)

(ii) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ශ්‍රමහමුදා සහභාගිත්ව අනුපාතිකය සාපේක්ෂ වශයෙන් පහල මට්ටමක පැවතීමට හේතු කවරේ ද?

(ලකුණු 07)

(iii) මෑත වර්ෂවලදී ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතිකය පහල වැටීමකට දායක වී ඇති ප්‍රධාන කරුණු කවරේ ද?

(ලකුණු 07)

07. (i) දිළින්දන්ට හිතකර වෘද්ධිය (Pro - poor growth) යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 06)

(ii) "ආදායම් දරිද්‍රතාව" සහ "මානව දරිද්‍රතාව" යන සංකල්ප අතර වෙනස දක්වන්න.

(ලකුණු 06)

(iii) "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සහ වතු අංශවල දරිද්‍රතාව ඉහල අගයක් ගනී" ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? මෙම අංශවල පවතින දරිද්‍රතාවට හේතු වශයෙන් ඔබ හඳුනා ගන්නා සාධක කවරේ ද?

(ලකුණු 08)

08. (i) යෝග්‍ය ප්‍රස්තාර සටහන් භාවිතා කරමින් ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය අතර වෙනස පෙන්වා දෙන්න

(ලකුණු 10)

(ii) උද්ධමනය පාලනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට අනුගමනය කළ හැකි පියවරයන් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 10)

**************************************************